# නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ මහනුවර සංග්‍රහය අත්හිටුවයි

**අසේල කුරුළුවංශ**

මැතිවරණ නීති උල්ලංඝනය කරමින් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ මහනුවර දිස්ත්‍රික් අපේක්ෂකයකු විසින් පේරාදෙණිය තානායමේ දී පාක්ෂිකයන් පිරිසකට රාත්‍රී ආහාරය සමඟ ලබා දීමට සැලසුම් කර තිබූ මත්පැන් සාදයක් අත්හිටුවීමට මහනුවර මැතිවරණ කාර්යාලයේ නිලධාරීන් පියවර ගෙන තිබේ. පැෆරල් සංවිධානය මගින් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලකට අනුව ඉකුත් 18 දා පස්වරු 6.00 ට පමණ එම ස්ථානයට ගිය මැතිවරණ කාර්යාලයේ නිලධාරීන් හෝටල් පරිපාලනයට දැනුම් දී ඇත්තේ මැතිවරණය සඳහා තරග වදින...

6 පිටුවට

# නව ප්‍රජාතන්ත්‍රවාදී...

අපේක්ෂකයින් විසින් සංවිධානය කරන රැස්වීම්වලට සහභාගි වන පාක්ෂිකයින්ට ආහාරපාන ආදියෙන් සංග්‍රහ කිරීම මැතිවරණ නීති උල්ලංඝනය කිරීමක් බවයි. මෙම රැස්වීම සඳහා හිටපු මන්ත්‍රීවරුන් වන මහින්දානන්ද අලුත්ගමගේ, අනුරාධ ජයරත්න යන මහත්වරු ඇතුළු පිරිසක් සහභාගි වීමට නියමිතය සිට ඇත. රැස්වීමට සහභාගි වූ සිය දෙනෙකුට පමණ අදාළ ස්ථානයේ දී රාත්‍රී ආහාරය ලබා දීමට සැලසුම් කර තිබුණු බව මහනුවර මැතිවරණ කාර්යාලය පවසයි.